# ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.
## ප්‍රධාන කාර්යාලය
## ඇබෑර්තු

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම පිණිස, ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | ශ්‍රේණිය | වැටුප |
|---|---|---|
| **සෞඛ්‍ය ප්‍රවේසම් හා පාරිසරික ප්‍රධානී** | ඒ -4 | රු.135400-5x1910-10x2335-168300 |

**පත්වීමේ ස්වභාවය** - ස්ථිර පදනම (ඇබෑර්තු සංඛ්‍යාව - 01)

**<u>තනතුරට අදාළ සුදුසුකම්</u>**

1. පිළිගත් ආයතනයකින් ලබාගත් සම්පූර්ණ වෘත්තීය සුදුසුකමක් සමඟ (වෘත්තීයට අදාළව )අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු තුනක (03) පශ්චාත් වෘත්තීය පළපුරුද්දක් තිබිය යුතුය.

නැතහොත්,

2. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ ඒ හා සමාන අන් සුදුසුකමක් සමඟ (වෘත්තීයට අදාළව) අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු හතක (07) පශ්චාත් උපාධි පළපුරුද්දක් තිබිය යුතුය.

**<u>කාර්ය ක්ෂේත්‍රය</u>**

1. සෞඛ්‍ය ප්‍රවේසම් හා පාරිසරික කටයුතු පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු අතර, ප්‍රතිපත්ති සකස් කිරීම හා කළමනාකරණය කිරීම පිළිබඳ මනා අවබෝධයක් හා පළපුරුද්දක් තිබිය යුතුය.

2. ඛනිජතෙල් ක්ෂේත්‍රයට අදාළ සෞඛ්‍ය ප්‍රවේසම් , ගිනි හා පාරිසරික කටයුතු හා බැඳි දේශීය හා ජාත්‍යන්තර පිළිගත් නීතිරීති සම්ප්‍රදායන් හා ප්‍රමිතීන් පිළිබඳවද මනා අවබෝධයක් ලබා තිබිය යුතු අතර, ආයතනයට අදාළ ක්‍රියාවලීන් යාවත් කාලීන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

3. වාර්ෂික අය වැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හා තත්ත්ව පාලන කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය පිළිබඳ හැකියාවක් තිබිය යුතු අතර, විෂයන්ට අදාළ කටයුතු සම්බන්ධයෙන් විධායක කමිටු රැස්වීම්වලට සහභාගීවීමට ද අනෙකුත් කාර්යාංශ හා ඒවායේ ප්‍රධානීන් සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

4. ඛනිජතෙල් නිෂ්පාදනයට අදාළ ක්‍රියාකරවුම් හා නඩත්තු ක්‍රියාවලීන් පිළිබඳ හා ඒ ආශ්‍රිත යන්ත්‍ර හා යන්ත්‍රාගාරවලට අදාළ සෞඛ්‍ය ප්‍රවේසම් හා පාරිසරික කටයුතු පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය.

5. ගිනි හා ප්‍රවේශම් කටයුතු සම්බන්ධ දේශන පැවැත්වීම හා ප්‍රායෝගික අභ්‍යාස පැවැත්වීමට අවශ්‍ය දැක්ම හා කුසලතාවයෙන් යුක්ත විය යුතුය.

6. ක්ෂේත්‍රයට අදාළ විෂයයන් පිළිබඳව යන්ත්‍රස්ථාන, නිමා, බෙදුම්පලවල්, කාර්යාල සේවකයින් හා පාරිභෝගිකයින් ද දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා වැඩ මුළු ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැනි දෑ සකස් කිරීමට හා ඒවා අවශ්‍ය පරිදි ක්‍රියාත්මක කරවීමට මනා හැකියාවක් තිබිය යුතුය.

7. ක්ෂේත්‍රයට අදාළ පිටස්තර සම්මන්ත්‍රණ, වැඩ මුළු ආදියට සහභාගීවීමේ හැකියාවක් තිබිය යුතු අතර, රාජකාරියේ පැන නගින නොයෙකුත් ගැටළු සංස්ථාවේ හෝ රජයේ අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කොට නිරාකරණය කර ගැනීමේ මනා හැකියාවක් තිබිය යුතුය.

8. ක්ෂේත්‍රයට අදාළ ගිනි ප්‍රවේසම් හා අනෙකුත් උපකරණ ඇණවුම් කිරීම හා ඒවා පිළිබඳව අවශ්‍ය උපදෙස් ලබාදීමට හැකියාවක් තිබිය යුතුය.

9. හදිසි අවස්ථා පිළිවෙත් හා ප්‍රායෝගික ව්‍යායාමයන් සැලසුම් කිරීම පිළිබඳ හැකියාවක් තිබිය යුතුය.

<u>වයස් සීමාව</u>

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට නොවැඩිවීම (රජයේ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

<u>අමතර ප්‍රතිලාභ</u>

සංස්ථාවේ වෛද්‍යාධාර ක්‍රමය යටතේ නොමිලයේ වෛද්‍යාධාර පහසුකම්, නිවාස ණය පහසුකම් , වාහන ණය පහසුකම් යනාදිය හිමිවනු ඇත.

සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය සඳහා සේවකයා තම වැටුපෙන් 10% ක ප්‍රමාණයකින් දායක විය යුතු අතර, ඒ සඳහා සංස්ථාවෙන් 15% ක ප්‍රමාණයක් ගෙවනු ලැබේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙනුවෙන් වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සංස්ථාවෙන් ගෙවනු ලැබේ.

<u>අයදුම්කිරීමේ පිළිවෙල.</u>

සංස්ථා වෙබ් අඩවියේ (www.ceypetco.gov.lk ) පළ කර ඇති පොදු අයදුම්පත්‍රයේ ආකෘතිය භාවිතා කර ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය සමඟ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව විස්තරාත්මක අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු වේ.

රජයේ දෙපාර්තමේන්තුවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු අතර, ඔවුන් විසින් අදාළ අයදුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත්, තම ආයතනයෙන් මුදා හැරීමට ඇති හැකියාව සඳහන් කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර, 2018..04..02....... දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

සභාපති
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.
අංක.609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

2018.03.19 දින,
එස්/එස්